# සාමණේර බණ දහම් පොත.

ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථා

ප්‍රකාශක:

ඩී. ජේ. අලහකෝන් මහත්මාව

යූ. කේ. එඩ්මන්ඩ් මහත්මාව

2531

1987 ජුනි 17

प. वलापाल P. Walpola

# සංඥාපනය

බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්ව වර්ෂයක් පිරෙන තුරුම කුලපුත්‍රයන් පැවිදි කිරීමට අනුදැන වදළේ සරණාගමන උපසම්පදාවෙහි පිහිටුවීම වශයෙනි. ප්‍රථම බුද්ධ වර්ෂයෙහි සාමණේර ප්‍රව්‍රජ්‍යාවක් නොවීය. තිසරණයෙහි පිහිටුවීමෙන් ම උපසම්පදාවෙහි පිහිටීම වන්නේය. එහෙත් බුදුපුත් රාහුල කුමරුවන් පැවිදි කළ තැන් පටන් සරණාගමන උපසම්පදාව ප්‍රතික්ෂෙප කොට සාමණේර ප්‍රව්‍රජ්‍යාව අනුදන්නා ලදී. එතැන් සිට උපසම්පද සීලය අනුදන්නා ලද්දේ ඤත්තිචතුත්ථ කර්මයෙනි. සරණාගමන විධි සාමණේර දශ ශීලය, සාමණේරයන් විසින් පිරිය යුතු වත් පිළිවෙත් චාරිත්‍ර වාරිත්‍ර විධි සියල්ල පනවා වදළේ රාහුල ප්‍රව්‍රජ්‍යාවෙන් පසුවය.

සැදැහැයෙන් සසුන් ගතවන කුලපුත්‍රයන් වෙත මහා කරුණාවෙන් අනුදැන වදළ නිර්මල වූ නෛර්යාණික ප්‍රතිපත්ති මාර්ගය විනය පිටකයෙන් හා සූත්‍රාන්ත පිටකයෙන් ද ගෙන **සාමණේර බණ දහම් පොත** නමින් පැරණි ආචාර්යයන් වහන්සේ නමක් විසින් සකයා ඇති මේ ග්‍රන්ථය වනාහි අතිශයින් අගනා ප්‍රශස්ත ග්‍රන්ථ රත්නයකි. මෙහි ඇතුළත් පිළිවෙත් මග අනුගමනය කරන පැවිද්දෝ ඒකාන්තයෙන් බුදු සසුන සුරකින්නෝම වෙති.

සසර දුකින් මිදී සතර මග සතර ඵල පිළිවෙළින් නිවනට පැමිණීමේ නිශ්ශරණාධ්‍යාශයෙන් සසුන් පිළිවෙත් අනු පිළිවෙළින් පුරනු කැමතිව, ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රව්‍රජ්‍යාව ලබන ශ්‍රද්ධා ප්‍රව්‍රජිත කුලපුත්‍රයන් උදෙසා මේ **සාමණේර බණ දහම් පොත** සංස්කරණය කොට මුද්‍රණය කරනු ලබන්නේ සම්බුදු සසුන ආරක්ෂා කිරීමේ උදාරාධ්‍යාශයෙන් සමාරබ්ධ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවට සතිස් වසර පිරීම නිමිත්තෙනි.

මේ පොත මුද්‍රණය කිරීමට අනුමත කරමින් උපදෙස් දෙවා වදළ අති පූජ්‍ය පණ්ඩිත මාතර සිරි ඤාණාරාමාභිධාන මහෝපාධ්‍යාය මාහිමියන් වහන්සේ, අති පූජ්‍ය රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංසාභිධාන මාහිමියන් වහන්සේ ද යන ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාධිපති ශාසන භාරධාරී මාහිමියන් වහන්සේ දෙනමට තෙරුවන් ගුණ බෙලෙන් නිරෝගී සුව දීර්ඝායුඃ ශ්‍රී ශාන්ති අත්වේවා.

පොත මුද්‍රණයට සුදුසු ලෙස සම්පූර්ණයෙන් පිටපත් කළ පූජ්‍ය මාතලේ ධම්මින්ද ආයුෂ්මතුන් වහන්සේටත්, ධර්මදාන වශයෙන් මෙය පිරිනමන කොළඹ මරදානේ පිත්වත් ඩී. ජේ. අලහකෝන් මහත්මාව ඇතුළු දරු පිරිසටත්, ඉමහත් උද්‍යොගයෙන් මුද්‍රණ කටයුතු ඉටු කළ කොළඹ මරදාන සමයවර්ධන මුද්‍රණාලයේ අධිපති තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් මෛත්‍රී ආශිර්වාද පූර්වාංගම අවංක ස්තුතිය පිරිනමන අතර ඒ සැමට ආයුරාරෝග්‍යාදි සම්පත් සිද්ධව ප්‍රාර්ථනීය බෝධියෙන් ශාන්ත නිවන් සුව අත්වේවා යි මෙත් සිත් පවත්වමි.

**"චිරං තිට්ඨතු ලොකස්මිං - සම්මා සම්බුද්ධ ශාසනං"**

මෙයට,

**නාඋයනේ අරියධම්ම**

# පටුන


පැවිද්ද ඉල්ලීමේ වාක්‍යය 1
නිග්ගහීතාන්ත සරණාගමනය 2
සාමණේර දශ ශීලය 2
සිවුපස ප්‍රත්‍යවේක්‍ෂා කරන ක්‍රමය 3
අතීත ප්‍රත්‍ය වේක්‍ෂා 4
වත්තිංසාකාරය 5
ප්‍රතීත්‍ය සමුත්පාදය 5
හෙරණසික 6
දින චරියාව 7
චතුපාරිශුද්ධි ශීලය 9
සෙඛියා 11
සෙඛියා සන්නය 14
පිළිකුල් භාවනා සන්නය 17
වර්තමාන ප්‍රත්‍ය වේක්‍ෂාත් 19
ධුතාඞ්ග 20
දසනෑයෝ 21
සතර කමටහන් 22
ඈණවුම් පිරිත 24
දස ධම්ම සුත්තං 25
මහා මඞ්ගල සුත්තං 26
රතන සුත්තං 27
කරණීය සුත්තං 28
ඛන්ධ පරිත්තං 29
මෙත්ත පරිත්තං 30
මිත්තානි සංසං 30
මොර පරිත්තං 31
චන්ද පරිත්තං 31
සූරිය පරිත්තං 32
ධජග්ග සුත්තං 32
මහා කස්සපත්ථෙර බොජ්ඣඞ්ගං 34
මහාමොග්ගල්ලානත්ථෙර බොජ්ඣඞ්ගං 35
මහා චුන්දත්ථෙර බොජ්ඣඞ්ගං 37
ගිරිමානන්ද සුත්තං 38
ඉසිගිලි සුත්තං 41
ජයමංගල ගාථා 44
මහා මංගල ගාථා 45
පින්දීම 46
අටවිසි පිරිත 47
ජිනපඤ්ජරය 47
අංගුලිමාල පිරිත 49
වට්ටක පිරිත 50
මත්ස්‍යරාජ පිරිත 50
සුත්තුද්දෙස උපෝසථය 51
පිරිසිදු පොහොය කරන කර්ම්වාක්‍යය 51
අධිෂ්ඨාන පොහොය කරන කර්ම්වාක්‍යය 51
ආපත්ති ආරෝචනය 52
චීවරාධිෂ්ඨාන වාක්‍යය 52
චීවර වීකප්පන වාක්‍යය 52
පවාරණ වාක්‍යය 53
කඨින චතුරණ වාක්‍යය 54
කඨිනානුමෝදනා වාක්‍යය 54
තිසු සමාදන්වන වාක්‍යය 54

# සාමණේර බණ දහම් පොත.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

## පැවිද්ද ඉල්ලීමේ වාක්‍යය.

උපාධ්‍යායන්ට වැඳගෙන උත්කුටුකාසනයෙන් හිඳ මෙසේ කිය යුතුයි.

ඔකාස අහං භන්තෙ පබ්බජ්ජං යාචාමි.
දුතියම්පි අහං භන්තෙ පබ්බජ්ජං යාචාමි.
තතියම්පි අහං භන්තෙ පබ්බජ්ජං යාචාමි

සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ඡිකරණත්ථාය, ඉමං කාසාවං ගහෙත්වා පබ්බාජෙථ මං භන්තෙ, අනුකම්පං උපාදාය, දුතියම්පි සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ඡිකරණත්ථාය ඉමං කාසාවං ගහෙත්වා පබ්බාජෙථ මං භන්තෙ, අනුකම්පං උපාදාය. තතියම්පි සබ්බදුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ඡිකරණත්ථාය, ඉමං කාසාවං ගහෙත්වා පබ්බාජෙථ මං භන්තෙ, අනුකම්පං උපාදාය.

මෙසේ මේ වාක්‍යය තුන් යළක් කියා උපාධ්‍යායන් අතට සිවුරු පිළිගන්වා නැවත උත්කුටුකාසනයෙන් වැඳගෙන හිඳ:-

**සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ඡිකරණත්ථාය, එතං කාසාවං දත්වා, පබ්බාජෙථ මං භන්තෙ, අනුකම්පං උපාදාය දුතියම්පි -පෙ- උපාදාය. තතියම්පි සබ්බ -පෙ- උපාදාය.**

නැවත උපාධ්‍යායන් වහන්සේ සිවුරු පටිය ග්‍රීවයෙහි බහනා කල්හි ''පටිසඞ්ඛා යොනිසො චීවරං පටිසෙවාමි'' යනාදී චීවර ප්‍රත්‍යවේක්ෂා වාක්‍යය කියයුතු, උපාධ්‍යායන් වහන්සේ කෙසා, ලොමා නඛා, දන්තා, තචො, යන තච පඤ්චක කර්මස්ථානය අනුලෝම, ප්‍රතිලෝම වශයෙන් දුන් කල්හි වාචොද්ගත කොට කියා, රැගෙන ගොස් ''සෙඛියා'' වෙහි කී පරිදි පිරිමඬුළු කොට හඳනය ඇඳ එකාංශව සිවුරු පෙරවා අවුත් සංඝයාගේ පා වැඳ, උපාධ්‍යායන් වහන්සේ වෙත පැමිණ පසඟ පිහිටුවා වැඳ:-

**ඔකාස අහං භන්තෙ, තිසරණෙන සද්ධිං පබ්බජ්ජා දස සීලං ධම්මං යාචාමි. අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ, දුතියම්පි - ඔකාස - පෙ - තතියම්පි - ඔකාස - පෙ - භන්තෙ.**

යන මේ වාක්‍යයෙන් තිසරණ සහිත පැවිදි දසසිලය ඉල්විය යුතු. එසේ ඉල්වූ කල්හි උපාධ්‍යායන් වහන්සේ විසින් සරණාගමනය මකාරාන්තව ද නිග්ගහීතාන්තව ද දිය යුත්තේය. තමා විසිනුත් එලෙස කිය යුතුයි.

## නිග්ගහීතාන්ත සරණාගමනය

බුද්ධං සරණං ගච්ඡාමි,
ධම්මං සරණං ගච්ඡාමි,
සඞ්ඝං සරණං ගච්ඡාමි,

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි,
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි,
දුතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි,

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි,
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි,
තතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි,

## මකාරාන්ත සරණාගමනය

බුද්ධම් සරණම් ගච්ඡාමි,
ධම්මම් සරණම් ගච්ඡාමි,
සඞ්ඝම් සරණම් ගච්ඡාමි,

දුතියම්පි බුද්ධම් සරණම් ගච්ඡාමි,
දුතියම්පි ධම්මම් සරණම් ගච්ඡාමි,
දුතියම්පි සඞ්ඝම් සරණම් ගච්ඡාමි,

තතියම්පි බුද්ධම් සරණම් ගච්ඡාමි,
තතියම්පි ධම්මම් සරණම් ගච්ඡාමි,
තතියම්පි සඞ්ඝම් සරණම් ගච්ඡාමි,

## සාමණේර දසසීලය

පාණාතිපාතා වේරමණී, අදින්නාදානා වේරමණී, අබ්‍රහ්මචරියා වේරමණී, මුසාවාදා වේරමණී, සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී, විකාල භෝජනා වේරමණී, නච්ච ගීත වාදිත විසූක දස්සනා වේරමණී, මාලාගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී, උච්චාසයන මහාසයනා වේරමණී, ජාතරූප රජත පටිග්ගහණා වේරමණී,

ඉමානි පබ්බජ්ජා දස සික්ඛාපදානි සමාදියාමි, යනුවෙන් උපාධ්‍යා-යන් විසින්ම කියවා සමාදන් කරවිය යුතුයි.

## එතැන් පටන් ළදරු සමණේරයාට පාඩම් කරවිය යුතු බණ දහම්

# සිවුපස ප්‍රත්‍යවේක්ෂා කරන ක්‍රමය

පටිසඞ්ඛා යොනිසො චීවරං පටිසෙවාමි යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංස මකස වාතාතපසිරිංසප සම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව හිරිකොපීනපටිච්ඡාදනත්ථං,

මේ පාඨය සිහිකරමින් සිවුරු හැඳීම් පෙරවීම් කටයුතුයි.

පටිසඞ්ඛා යොනිසො පිණ්ඩපාතං පටිසෙවාමි. නෙව දවාය, න මදූය, න මණ්ඩනාය, න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා, යාපනාය, විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වෙදනං න උපපාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති, අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති,

මේ පාඨය සිහි කරමින් පිණ්ඩපාතය පිළිගැනීම හා වැළඳීම කටයුතුයි.

පටිසඞ්ඛා යොනිසො සෙනාසනං පටිසෙවාමි, යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංස මකස වාතාතප සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය යාවදෙව උතුපරිස්සය විනොදනං, පටිසල්ලානාරාමත්ථං.

මේ පාඨය සිහි කරමින් විහාරයට (සෙනසුනට) ඇතුල් වීමද, ඇඳ, පුටු, කළාල, ඇතිරි ආදිය පරිභොගය ද කටයුතුයි.

පටිසඞ්ඛා යොනිසො ගිලාන පච්චය භෙසජ්ජපරික්ඛාරං පටිසෙවාමි, යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය, අබ්‍යාපජ්ඣ පරමතායාති.

මේ පාඨය සිහිකරමින් ගිලන්පස බෙහෙත් පිරිකර පිළිගැනීම හා වැළඳීම කටයුතුයි.

# අතීත ප්‍රත්‍යවෙක්ෂා

මයාපච්චවෙක්ඛිත්වා, අජ්ජ යං චීවරං පරිභුත්තං, තං යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංස මකස වාතාතප සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය යාවදෙව හිරිකොපීන පටිච්ඡාදනත්ථං.

යථා පච්චයං පවත්තමානං ධාතුමත්තමෙවෙතං යදිදං චීවරං තදුපභුඤ්ජකො ච පුග්ගලො ධාතුමත්තකො නිස්සත්තො නිජ්ජීවො, සුඤ්ඤො, සබ්බානි පන ඉමානි චීවරානි අජිගුච්ඡනීයානි ඉමං පූතිකායං පත්වා අතිවිය ජිගුච්ඡනීයානි ජායන්ති.

මයා පච්චවෙක්ඛිත්වා අජ්ජ යො පිණ්ඩපාතො පරිභුත්තො සො, නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසණාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය, විහිංසූපරතියා, බ්‍රහ්මචරියානුග්ගහාය ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රාච මෙ භවිස්සති අනවජ්ජතාච ඵාසු විහාරො චාති.

යථා පච්චයං පවත්තමානං ධාතුමත්තමෙවෙතං යදිදං පිණ්ඩපාතො, තදුපභුඤ්ජකො ච පුග්ගලො ධාතුමත්තකො නිස්සත්තො, නිජ්ජීවො සුඤ්ඤො, සබ්බොපනායං පිණ්ඩපාතො අජිගුච්ඡනීයො ඉමං පූතිකායං පත්වා අතිවිය ජිගුච්ඡනීයො, ජායති.

මයාපච්චවෙක්ඛිත්වා අජ්ජ යං සෙනාසනං පරිභුත්තං තං යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය ඩංසමකස වාතාතපසිරිංසප සම්ඵස්සානං පටිඝාතාය යාව දෙව උතුපරිස්සය විනොදනං පටිසල්ලානාරාමත්ථං

යථා පච්චයං පවත්තමානං ධාතුමත්තමෙවෙතං යදිදං සේනාසනං තදුපභුඤ්ජකොච පුග්ගලො ධාතුමත්තකො, නිස්සත්තො නිජ්ජීවො සුඤ්ඤො, සබ්බානි පන ඉමානි සෙනාසනානි අජිගුච්ඡනීයානි ඉමං පූතිකායං පත්වා අතිවිය ජිගුච්ඡනීයානි ජායන්ති.

මයා පච්චවෙක්ඛිත්වා අජ්ජ යො ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරො පරිභුත්තො සො යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය අබ්‍යාපජ්ඣ පරමතායාති.

යථා පච්චයං පවත්තමානං ධාතුමත්තමෙවෙතං යදිදං ගිලාන පච්චය භෙසජ්ජ පරික්ඛාරො තදුපභුඤ්ජකො ච පුග්ගලො ධාතුමත්තකො නිස්සත්තො, නිජ්ජීවො, සුඤ්ඤො, සබ්බොපනායං ගිලාන පච්චය භෙසජ්ජ පරික්ඛාරො අජිගුච්ඡනීයො ඉමං පූතිකායං පත්වා අතිවිය ජිගුච්ඡනීයො ජායති.

මේ අතීත පස්විකුම් නොවරදවා උදය - සවස පිරිත් කියන කාලයෙහි කිය යුතුයි.

## ද්වත්තිංසාකාරය.

අත්‍ථි ඉමස්මිං කායෙ කෙසා, ලොමා නඛා දන්තා තචො, මංසං නහාරූ අට්ඨී අට්ඨි මිඤ්ජා වක්කං, හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං, අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බං ලොහිතං සෙදො මෙදො, අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තං මත්ථකෙ මත්ථලුඞ්ගන්ති.

## ප්‍රතීත්‍ය සමුත්පාදය

අවිජ්ජා පච්චයා සඞ්ඛාරා, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා, පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරාමරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා සඞ්ඛාර නිරොධො සඞ්ඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා නාම රූප නිරොධො, නාම රූප නිරොධා සළායතන නිරොධො, සළායතන නිරොධා ඵස්ස නිරොධො, ඵස්ස නිරොධා වෙදනා නිරොධො, වෙදනා නිරොධා තණ්හා නිරොධො, තණ්හා නිරොධා උපාදාන නිරොධො උපාදාන නිරොධා භව නිරොධො, භව නිරොධා ජාති නිරොධො, ජාති නිරොධා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

අනෙක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසන්තො - දුක්ඛා ජාති පුනප්පුනං

ගහකාරක දිට්ඨොසි - පුනගෙහං න කාහසි-
සබ්බා තෙ ඵාසුකා භග්ගා - ගහකූටං විසංඛිතං-
විසංඛාර ගතං චිත්තං - තණ්හානං ඛයමජ්ඣගා'ති.

## මෛත්‍රී භාවනාව

අහං අවෙරො හොමි. අබ්‍යාපජ්ඣො හොමි. අනීඝො හොමි. සුඛී අත්තානං පරිහරාමි. අහං විය මය්හං ආචරියුපජ්ඣායා මාතා පිතරො හිතසත්තා මජ්ඣත්තික සත්තා වෙරී සත්තා අවෙරා හොන්තු. අබ්‍යාපජ්ඣා හොන්තු. අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු දුක්ඛා මුච්චන්තු. යථාලද්ධ සම්පත්තිතො මාවිගච්ඡන්තු

කම්මස්සකා. ඉමස්මිං විහාරෙ, ඉමස්මිං ගොචරගාමෙ ඉමස්මිං නගරෙ, ඉමස්මිං ලඞ්කාදීපෙ, ඉමස්මිං ජම්බුදීපෙ, ඉමස්මිං චක්කවාළෙ ඉස්සරජ්ජා සීමට්ඨක දෙවතා සබ්බෙ සත්තා අවෙරා හොන්තු අබ්‍යාපජ්ඣා හොන්තු. අනීඝාහොන්තු. සුඛී අත්තානං පරිහරන්තු. දුක්ඛා මුච්චන්තු යථාලද්ධ සම්පත්තිතො මාවිගච්ඡන්තු කම්මස්සකා, පුරත්ථිමාය දිසාය, දක්ඛිණාය දිසාය, පච්ඡිමාය දිසාය, උත්තරාය දිසාය, පුරත්ථිමාය අනුදිසාය, දක්ඛිණාය අනුදිසාය, පච්ඡිමාය අනුදිසාය, උත්තරාය අනුදිසාය, හෙට්ඨිමාය දිසාය, උපරිමාය දිසාය.

සබ්බෙ සත්තා, සබ්බෙ පාණා, සබ්බෙ භූතා, සබ්බෙ පුග්ගලා සබ්බෙ අත්තභාව පරියාපන්නා, සබ්බා ඉත්ථියො සබ්බෙ පුරිසා, සබ්බෙ අරියා. සබ්බෙ අනරියා, සබ්බෙ දෙවා, සබ්බෙ මනුස්සා, සබ්බෙ විනිපාතිකා, අවෙරා හොන්තු, අබ්‍යාපජ්ඣා හොන්තු. අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු. දුක්ඛා මුච්චන්තු යථාලද්ධ සම්පත්තිතො මාවිගච්ඡන්තු කම්මස්සකා.

## හෙරණ සික

හෙරණ හට දසසිල්, දසසික, දසපරිජ්, දසනාසනා, දස දඬුවම් වත් නම්:-

හෙරණ හට දස සිල් නම් කවරයත්:- පණිවායෙන් දුරුවීම, අයිනාදතින් දුරුවීම, අබ්‍රම්සරින් දුරුවීම, මුසවායෙන් දුරුවීම, රහ මෙරින් දුරුවීම, විකල් බොජුනෙන් දුරුවීම, නටනු ගයනු වයනු විසුලූ දස්නෙන් දුරුවීම මල්ගඳ විලවුන් ඇ දැරීමෙන් දුරුවීම, උසසුන් මහස්නෙන් දුරුවීම, රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් දුරුවීම යන මේ හෙරණ හට දස සිල් නම් වේ. හෙරණ හට දස සික නම් කවරහ යත්:- මේ දස සිල් ම හික්මවිය යුතු හෙයින් දසසික නම් වේ.

හෙරණහට දස පරිජ් නම් කවරයත්:- දත දත සතක්හු දිවි ගැලවුව පරිජ් වේ. දත දත දනා අයත් දහු වැලයකුදු සොර සිතින් ගත පරිජ් වේ. දත දත තිරිසන්ගිය මාගමක් හා ද මෙවුන්දම් සෙවිය පරිජ් වේ. දත දත සිනාමුසු බසිනුදු මුසවා කිව පරිජ් වේ. දත දත පිණි බිඳක් සාද රා විකක් පුව පරිජ් වේ. බුදු රුවන්හි අගුණු කිව පරිජ් වේ. දමුරුවන්හි අගුණු කිව පරිජ් වේ. සගුරුවන්හි අගුණු කිව පරිජ් වේ. පුවතත් මෙහෙණක හා ද මෙවුන්දම් සෙවිය පරිජ් වේ. නියත මිසිදිටු ගත පරිජ් වේ. යන මේ හෙරණ හට දස පරිජ් නම් වේ.

ශ්‍රාමණේර හට දස නාසනා නම් කවරයත්:- මේ දස පරිජ්ජම දසනාසනා නම් වේ. මෙහි පසෙක් ලිඞ්ග නාසනා යි. පසෙක් සබ්බ නාසනායි.

පස් ලිඞ්ග නාසනා නම් කවරයත්:- දැන දැන සතක්හු දිවි ගැලවූම, දැන දැන දකා අයත් දුහු වැලැක්වූ සොර සිතින් ගත දැන දැන තිරිසන් ගිය මාගමක හා ද මෙවුන්දම් සෙවීය, දැන දැන සිතා මුසු බසිනුදු මුසවා කිව, දැන දැන පිණි බිඳක් සාද රා ටිකක් පුව, යන මේ පස ලිඞ්ගනාසනා නම් වේ.

පස් සබ්බ නාසනා නම් කවරයත්:- බුදුරුවන්හි අගුණ කිම; දම්රුවන්හි අගුණ කිව, සඟුරුවන්හි අගුණ කිව, පුමතත මෙහෙණක හා ද මෙවුනදම් සෙවිය, නියත මිසදිටු පගත යන මේ පස සබ්බනාසනා නාම වේ.

ශ්‍රාමණේර හට දස දඬුවම් වත් නම් කවරයත්:- වි කල් බොජුන නටනු, ගනු, වයනු; විසුලු දස්න, මල් ගඳ විලවුන් ඇ දැරීම, උසසුන් මහ අස්නෙහි ඉඳීම, රන් රිදී, මසු, කහවණු පිළිගැනීම, පැවිද්දන්ට උපද්‍රව සඳහා පයෝ කිරීම, පැවිද්දන් ලග්නා අවසින් නොරනට පයෝ කිරීම, පැවිද්දන්ට අක්‍රොෂ පරිභව කිරීම, පැවිද්දන් පැවිද්දන් කෙරෙහි බිඳුවීම, යන මේ ශ්‍රාමණේර හට දස දඬුවම් වත් නාම වේ. මෙහි පසෙක් වැලි දඬුවම් වත. පසෙක් සඟරම්හි නොරනාවත.

වැලි දඬුවම්වත් පස නම් කවරයත්:- විකල් බොජුන - නටනු - ගනු - වයනු විසුලු දස්න, මල් ගඳ විලවුන් ඇ දැරීම, උසසුන් මහ අස්නෙහි ඉඳීම, රන - රිදී - මසු - කහවණු පිළිගැනීම යන මේ පස වැලි දඬුවම්වත් නම් වේ.

සඟරම්න් නෙරනාවත් පස නම් කවරයත්:- "භික්ඛූනං අලාභාය පරිසක්කති, භික්ඛූනං අනත්ථාය පරිසක්කති, භික්ඛූනං අවාසාය පරිසක්කති භික්ඛූනං අක්කොසති පරිභාසති, භික්ඛූ භික්ඛූහි භෙදෙති" යන මේ පස සඟරම්න් නෙරනාවත් නාම වෙ.

## දිනචරියාව

සැදැහැයෙන් සසුන්වත් කුල දරුවන් විසින් අරුණට පළමුව දැහැටි වළඳා, මුහුණ සෝදා, හැමද නිමවා, පැන් පෙර හා තබා විවේකස්ථානයක හිඳ, සිල් බැලීමෙන්, විවේකවත් සැපයීමෙන් තුන් පැයක් යවා ගෙඩිය ගැසූ කල "සබ්බං සඞ්ඛතං අසාරං" යනාදීන් සිහිපත් කරමින් දාගැප් මහ බෝයට එළඹ වත් සපයා,

පිදිය හැකි වතත් ඇත පුදා, "ඉතිපි සො භගවා" යනාදීන් නව අරහාදී බුදු ගුණ සිහි කොට අනාවර්ජිත නොවූ, වැද එකවිටම ආපුච්ඡා කොට ගෙන, නැගී සිට පිළිවෙලින් පත්කඩ තබා වැද ගෙන, ලියා බලා අවචඣායාව පොහෝ කළ දවස, බුද්ධ වශීය කියාඥී කල,

තස්ස පාසාදිකං හොති - පත්ත චීවර ධාරණං
පබ්බජ්ජා සඵලා තස්ස - යස්ස සීලං සුනිම්මලං

යනාදීන් සිහිකොට, පා සිවුරු ධරව කමටහන් ගෙන ගමට වදනා කල, ආචාර්ය උපාධ්‍යායන්ට නො දුරුව නො ලංව ගොස් සිවුරු වළඳනා තැන හැමද, පාත්‍රය මුදුදීලා කැටුව ගොස්, ගමට වැද ස්ත්‍රී පුරුෂ ඇත් අස් රථ පාබල සෙනග නොයෙක් දික් නොබලා සෙඛියා කී සෙයින් සිගාගෙන කැටුව නික්ම,

පාත්‍රය හා සඟල සිවුර දෙඅතින් අල්වාගෙන කමටහන් මෙනෙහි කරනුවන් විසින් වෙහෙරට අවුත් සිවුරු වස පියා තබා, ඇඳිනා අසුන් පණවා, පත්සලා පා දෙව පැන් මලා දැහැටි දඬු එළවා දී, තමාගේ පාත්‍රා පයර්‍යාපන්නයෙන් අතුන්ට දන් දීලා කිසිවක් උන් නොගතහොත් බත් සරලුවක් වත් දන් දීලා, ඇනෙක සේ පස් වකාගෙන සෙඛියා කී සෙයින් අහර කිස නිමවා, පිළිවෙළින් වැඩි මහලු තැන්ගේ පාත්‍ර සෝදා වත් සපයා බොජුන් හල හැමද, ගුරුන්ට වත් දක්වා ඉක්බිති ගුරුන් හා බුදුන් වැඳ ගෙන විවේක ස්ථානයක උද අතීත පස්විකුම් පස්විකා, සිල් බලා මෙත් කොට ගෙන පැයක් විතරකින් අතගසාලු කල පොත කියවා පත ලියවා අසන පිරුව-හන දෙය වනපොත් කොට, විදර්ශනා ධුරයෙහි යෙදෙන්නවුන් විසින් වෙන වෙනම හිඳ තමහට නියම පෙළ වනපොත් දීලා, අසාගෙන වේලා ඇතහොත් වනපොත් කොට ලා රෑ වෙන්නට පැයක දී ගෙමලු හැමැන්ද සුතු.

වත් පැමිණියන් විසින් ගිණි එළවා පහන් පුදා, බණ සළසා ආරාධනා කොට පයට පැන් එලවා, පිළිවෙළින් හිඳ බණ අසා පිරිත් බැණගෙන ගුරුන්ට වත් දක්වා විචාලමනා සැක ඇත විචාරාගෙන පුහුණුවන් ඇත පිරිවහා සෙඛියං චතුපාරිශුද්ධි ශීලය පිරිවහාගෙන තම තම් සැතපෙන ගෙහි වැඩිමහල්ලන් ඇත වත් සපයා වැද අවකාශ ගෙන සැතපෙන අස්නේ හිඳ පස් විකාගෙන සතර කමටහන් මෙනෙහිකොට "අලුයම නැගෙමියි" යන සිතින් නිද්‍රොපගතව අලුයම නැගී පස්විකාගෙන සතර කමටහන් මෙනෙහි කොට රතන සූත්‍රයෙන් පිරිත් බැණ මෙත් කොටගෙන අරුණට පළමුව වත් සැපයීමෙක පළමු කී සෙයින්ම කරනුවන් විසින්, දෙවෙලෙහම

මෙත් පිරිත් සංවේග වස්තු අට අශුභ මරණ සති සිහි කරනුවන් විසින් එක්වත් දසධම්ම සූත්‍රය මෙනෙහි කිරීමෙන් ජන්දාදීන් අපායෙහි ගෙන හැර සිටුවන්නාක් මෙන් නොකොට ඔවුනොවුන්ගේ දුටු වරද කීමෙන් මෛත්‍රාවච් කර්මය පුරා,

"යො පන භික්ඛු ධම්මානු ධම්ම පටිපන්නො විහරති සාමීචි-පටිපන්නො අනුධම්මචාරී සො තථාගතං සක්කරොති ගරුකරොති මානෙති පූජෙති පරමාය පූජාය පටිපත්ති පූජාය" යි

වදාල අවවාදය සිත තබාගෙන බුදුන් මෙසේ ප්‍රතිපත්ති පූජාවෙන් පුදනුවන් විසින් මෙකී දිනචරියාව කෙලේ ඇද්දැයි විචාළ කල කළ-වුන් විසින් මුවෙන් නො බිණීමෙන් හා උවමනා කිසි කටයුත්තකට කාරණා කියාලීමෙන් හා පමා වැරැද්දකට වැලි ලාස්සක් ගෙන හැර මලුවෙහි ලා එක්වත් දිනචරියාව පසස්නන් විසින් සබ්‍රම්සරුන්ගේ සිවුරු ගෙත්තම් කිරීම්, පාත්‍රා පිසීම් ආදී වූ කුඩු මහත් කටයුත්තෙහි සමර්ථව, ඉදිසිත් ඇතිව වැඩිමහල්ලන්ට සුවචව මොලොක්ව පාපිස්නා බිස්සක් සෙයින් මත් නැතිව සතර පසයෙහි ලද දෙයකින් සතුටුව අල්ප කෘත්‍ය ඇතිව, පරිෂ්කාර දෙළසකින් වඩා නොගැන්මෙන් සචකිය පැවතුම් ඇතිව, සත්සුන් ඉඳුරන් ඇතිව, මුහු කළ නුවණින් යුක්තව කාය ගව්, වච් ගව් නැතිව කුලයා කෙරෙහි ද, ගණයා කෙරෙහි ද, නො ඇලී කුඩා වූවත් පාපයකුදු නොකොට මෙසේ ප්‍රතිපත්ති පූජා-වෙන් පුදනුවන් විසින් ලොව් ලොව්තුරා සැපත් සිද්ධ කටයුතුයි.

## චතුපාරිශුද්ධි ශීලය.

සීලය නම් සතර සංවර ශීලය, හේ කෙසේද යත්? ප්‍රාතිමොක්ෂ සංවර ශීලය, ඉන්ද්‍රිය සංවර ශීලය, ආජීව පාරිශුද්ධි ශීලය, ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය, යන මේ සතර සංවර ශීලය නම් වේ.

මෙහි ප්‍රාතිමොක්ෂ සංවර ශීලය නම් චාරිත්‍ර වාරිත්‍ර විසින් දෙකෙක් වේද. චාරිත්‍ර ශීලය නම් දාගුබ් හැමදුම්, ගෙත්තම් පන්නම් කිරීම්, කැලි කසල දැක දැක නො ඇදීම්, ගිලන්හට වැඩිමහල්ලන්ට සිල්වත් ගුණවත්නට මෙහෙ කිරීම්, ගුරුන් සිල්වතුන් තුන්වේලේ වැඳීම්, දාගැප් මහ බෝ තුන්වේලේ වැඳීම්, උපන් අහර ඇසුරු ඇති තැනට බෙදා දී වැළඳීම් පුහුණු බණ නොමැලිව පිරවීම් හදාරණ බණ දන්නවුන් ලවා කියවා ගෙන කී පරිද්දෙන් පුහුණු කිරීම්, හැඳීම් පෙරවීම් සකස් කොට සුපිළිසත්ව හැඳීම පෙරවීම, පැනීත්තෙහි ද පස ද වේලාවෙහි ද සඤ්ඤිත කාරිය කිරීම, යන මේ ආදී වත් පිළිවෙත් කිරීම චාරිත්‍ර ශීල නම් වේ.

## චාරිත්‍ර ශීලය නම්

මෙසේ නොකොට සිත් සකසා දශ අකුශල කර්මපථාදීන් නො කොට දශ අකුශල කර්මපථ කිරීමය. මෙසෙයින් සිරිත් විරිත් දෙකෙක් වූයේ ප්‍රාතිමොක්ෂ සංවර ශීලය නම් වේ.

## ඉන්ද්‍රිය සංවර ශීලය නම්

රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය, ධර්ම, යන මේ සාරමුණෙහි එල්බ උපදනා ලෝභ, ද්වේෂ, මොහ නමැති කෙලෙස් සොරුන් කෙරෙන් දුරුව චක්ෂුද්වාර, ශ්‍රොත්‍රද්වාර, ඝාණද්වාර, ජිහ්වාද්වාර, කායද්වාර, මනොද්වාර යන මේ සදොරින් නො වැද්දදී සිහි නමැති දොර පියලා සිහි නුවණ ඇතිව විසීම ඉන්ද්‍රිය සංවර ශීලය නම් වේ.

## ආජීව පාරිශුද්ධි ශීලය නම්

කයින් තෙපුලෙන් කරන ලද ප්‍රාණඝාත අදත්තාදාන කාම මිථ්‍යාචාර, මුසාවාද, පිසුනාවාචා, ඵරුසාවාචා, සම්ඵප්‍රලාපා යන මේ සත හා කුහනලපනාදීන් තමා කෙරෙහි නැති ගුණ නො පානාදීන් විසින් කැප සරුප් පරිද්දෙන් දැහැමින් සෙමින් දිවි පැවැත්වීම් ආදිය ආජීව පාරිශුද්ධි ශීලය නම් වේ.

## ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය නම්

දැහැමින් සෙමෙන් උපන් සතර පසයෙහි ලොභ, වෙෂ, මොහ, දුරුකොට මද යයි බොහෝ කොට නො ඉල්වා, සසර කතර ගෙවන්නාට කාරණා යයි සලකා පස්විකා වැළඳීම පරිභොග කිරීම් ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය නම් වේ.

මෙසෙයින් සතර සංවර ශීලය සැකෙවින් දත ඉගෙණ ගිහි ගෙයි ද, සස්නෙහි ද, සිටියවුන් විසින් දවස දවස පන්සිල්, පොහොය අටසිල් ද, වියසී ඇත දසසිල් ද රැක සිල්මල සෝධා පිරිසිදු ශීලයෙහි සිට සිල් පිරිය යුතු.

සබ්බදා සීල සම්පන්නො - පඤ්ඤවා සුසමාහිතො,
ආරද්ධ විරියො පහිතත්තො - ඕඝං තරති දුත්තරං,

කාය කම්මං තිධා වුත්තං - වාචා කම්මං චතුබ්බිධං,
මනසා තිවිධං චෙව - දසකම්ම පථා ඉමෙ.

පාණ ඝාත පරදබ්බං - පරදාරඤ්ච කායතො,
මුසා පෙසුඤ්ඤ ඵරුසා - සම්ඵප්පලාපං වාචතො.

අභිජ්ඣා චෙව ව්‍යාපාදෙ – මිච්ඡාදිට්ඨීව මානසො,
වත්තං න පරිපූරෙන්තො – න සීලං පරි පූරති.
අසුද්ධ සීලො දුප්පඤ්ඤො – දුක්ඛා න පරිමුච්චති,

යො ගවං නවිජානාති – න සො රක්ඛති ගො ගණං,
එවං සීලං අජානන්තො – කිං සො රක්ඛෙය්‍ය සංවරං.

කිකීව අණ්ඩං චමරීව වාලධිං –
පියංව පුත්තං නයනංව එකකං,
තථෙව සීලං අනුරක්ඛ මානකා,
සුපෙසලා හොථ සදා සගාරවා,

සුලද්ධා වත මෙ ලද්ධා – සද්ධා සුගත සාසනෙ,
සීලං මෙ යස්ස කල්‍යාණං – පරිසුද්ධ මඛණ්ඩිතං.

පාතිමොක්ඛං විසොධෙන්තො – අප්පෙව ජීවිතං ජහෙ,
පඤ්ඤත්තං ලොක නාථෙන – න භින්දෙ සීල සංවරං.

ඉමංහි සීලරතනං – ඉධචෙව පරත්ථච,
ආනිසංස වරෙ දත්වා – පච්ඡා පාපෙති නිබ්බුතිං.

## සෙඛියා,

ඉමෙ ඛො පනායස්මන්තො සෙඛියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

1. පරිමණ්ඩලං නිවාසෙස්සාමීති සික්ඛා කරණීයා,
2. පරිමණ්ඩලං පාරුපිස්සාමීති සික්ඛා කරණීයා,
3. සුප්පටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා,
4. සුප්පටිච්ඡන්නො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා,
5. සුසංවුතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා,
6. සුසංවුතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා,
7. ඔක්ඛිත්ත චක්ඛු අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා,
8. ඔක්ඛිත්ත චක්ඛු අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා,
9. න උක්ඛිත්තකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා,
10. න උක්ඛිත්තකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා,

## පරිමණ්ඩල වග්ගො පඨමො.

1. න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා,
2. න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා,

3. අප්පසද්දො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා,
4. අප්පසද්දො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා,
5 න කායප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා,
6. න කායප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා,
7. න බාහුප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා,
8. න බාහුප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා,
9. න සීසප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා,
10. න සීසප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා,

## උජ්ඣග්ඝික වග්ගො දුතියො.

1. න ඛම්භකතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා,
2. න ඛම්භකතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා,
3. න ඔගුණ්ඨිතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා,
4. න ඔගුණ්ඨිතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා,
5. න උක්කුටිකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා,
6. න පල්ලත්ථිකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා,
7. සක්කච්චං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා,
8. පත්තසඤ්ඤී පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා,
9. සමසූපකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා,
10. සමතිත්තිකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සක්ඛා කරණීයා,

## ඛම්භකත වග්ගො තතියො.

1. සක්කච්චං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති ~~සික්ඛාමීති~~ සික්ඛා කරණීයා,
2. පත්තසඤ්ඤී පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා,
3. සපදානං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා,
4: සමසූපකං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා,
5. න ථූපකතො ඔමද්දිත්වා පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා,
6. න සූපං වා බ්‍යඤ්ජනං වා ඔදනෙන පටිච්ඡාදෙස්සාමි භිය්‍යො කම්‍යතං උපාදායාති සික්ඛා කරණීයා,
7. න සූපං වා ඔදනං වා අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
8. න උජ්ඣානසඤ්ඤී පරෙසං පත්තං ඔලොකෙස්සාමීති සික්ඛා කරණීයා,
9. නාතිමහන්තං කබලං කරිස්සාමීති සික්ඛා කරණීයා,
10. පරිමණ්ඩලං ආලොපං කරිස්සාමීති සික්ඛා කරණීයා,

## සක්කච්ච වග්ගො චතුත්ථො

1. න අනාහටෙ කබළෙ මුඛද්වාරං විවරිස්සාමීති සික්ඛා කරණීයා,
2. න භුඤ්ජමානො සබ්බං හත්ථං මුඛෙ පක්ඛිපිස්සාමීති සික්ඛා කරණීයා,
3. න සකබළෙන මුඛෙන බ්‍යාහරිස්සාමීති සික්ඛා කරණීයා,
4. න පිණ්ඩුක්ඛෙපකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා,
5. න කබළාවච්ඡෙදකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා,
6. න අවගණ්ඩකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා,
7. න හත්ථ නිද්ධුනකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා,
8. න සිත්ථාවකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා,
9. න ජිව්හා නිච්ඡාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා,
10. න චපු චපු කාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා,

## කබළ වග්ගො පංචමො

1. න සුරු සුරු කාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා,
2. න හත්ථ නිල්ලෙහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා,
3. න පත්ත නිල්ලෙහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා,
4. න ඔට්ඨනිල්ලෙහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා,
5. න සාමිසෙන හත්ථෙන පානීය ථාලකං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා
6. න සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ජඩ්ඩෙස්සාමීති සික්ඛා කරණීයා,
7. න ජත්තපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා,
8. න දණ්ඩ පාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා,
9. න සත්ථ පාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා,
10. න ආවුධපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා,

## සුරු සුරු වග්ගො ජට්ඨො

1. න පාදුකාරුළ්හස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා,
2. න උපාහනාරුළ්හස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා,

3. න යානගතස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා,

4. න සයනගතස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා,

5. න පල්ලත්ථිකාය නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා,

6. න වෙඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා,

7. න ඔගුණ්ඨිත සීසස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා,

8. න ඡමාය නිසීදිත්වා ආසනෙ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා,

9. න නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා,

10. න ඨිතො නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා,

11. න පච්ඡතො ගච්ඡන්තො පුරතො ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා,

12. න උප්පථෙන ගච්ඡන්තො පථෙන ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා,

13. න ඨිතො අගිලානො උච්චාරං වා පස්සාවං වා කරිස්සාමීති සික්ඛා කරණීයා,

14. න හරිතෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා,

15. න උදකෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා,

## පාදුක වග්ගො සත්තමො

උද්දිට්ඨා ඛො ආයස්මන්තො සෙඛියා ධම්මා තත්ථා'යස්මන්තෙ පුච්ඡාමි. කච්චිත්ථ පරිසුද්ධා දුතියම්පි පුච්ඡාමි. කච්චිත්ථ පරිසුද්ධා තතියම්පි පුච්ඡාමි. කච්චිත්ථ පරිසුද්ධා පරිසුද්ධෙත්ථා'යස්මන්තො තස්මා තුණ්හී එවමෙතං ධාරයාමී'ති.

## සෙඛියා සන්නය

ආයස්මන්තෙනි, ආයුෂ්මත්නි! ඉමෙ ඛො පන සෙඛියා ධම්මා, මේ සෙඛියා ඇවැත්හු; උද්දෙසං, උදෙසීමට; ආගච්ඡන්ති, පැමිණෙත්.

1. පරිමණ්ඩලං, හාත්පසින් වටකොට; නිවාසෙස්සාමීති, (අඳනය) හඳිමියි; සික්ඛා, ශික්‍ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය හික්මිය යුතු යයි සේයි.

2. පරිමණ්ඩලං, හාත්පසින් වටකොට; පාරුපිස්සාමීති, පොරවමියි; සික්ඛා, ශික්‍ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

3. සුප්පටිච්ඡන්නො, සුපිළියත්ව මනාකොට හැඳ පොරවා; අනන්තරඝරෙ, ඇතුළු ගමෙහි; ගමිස්සාමීති, යමියි; සික්ඛා, ශික්‍ෂා (හික්මීම) තොමෝ; කරණීයා, කටයුත්තීය.

4. සුප්පටිච්ඡන්නො, සුපිළියත්ව; අන්තරඝරෙ, ඇතුළු ගම්හි නිසීදිස්සාමීති, හිඳිමියි-

5. සුසංවුතො, මනා සංවර ඇතිව; අන්තරඝරෙ, ඇතුළු ගම්හි; ගමිස්සාමීති, යමියි; සික්ඛා, ශික්‍ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

6. සුසංවුතො, මනා සංවර ඇතිව; අන්තරඝරෙ, ඇතුළු ගම්හි; නිසීදිස්සාමීති හිඳිමියි.

7. ඔක්ඛිත්තචක්ඛු. යට බලා හෙළන ලද ඇස් ඇතිව;

8. ඔක්ඛිත්ත චක්ඛු, (වියද්දඩු පමණ) බිම බලා හෙළන ලද ඇස් ඇතිව;

9 - 10 නඋක්ඛිත්තකාය, නොම නගන ලද සිරුර ඇතිව;

## පළමුවන පිරිමඬුළු වගයි

(1 - 2) උජ්ජග්ඝිකාය, මහත්වූ සිනා ඇතිව; අන්තරඝරෙ, ඇතුළු ගම්හි; න ගමිස්සාමීති, නොගෙමියි; අප්පසද්දො, දොළොස් රියනින් මත්තේ නොඇසෙන හඬ ඇතිව; (3 - 4)

(5 - 6) කායප්පචාලකං, කය සල සලා; (7 - 8) බාහුප්පචාලකං, අත සල සලා; (9 - 10) සීසප්පචාලකං, හිස සල සලා;

## දෙවන උජ්ජග්ඝික වගයි.

(1 - 2) ඛම්භකතො, උකුලෙහි තබන ලද අත් ඇතිව; (3 - 4) ඔගුණ්ඨිතො, හිස වසා පෙරවා ගෙන; (5) උක්කුටිකාය, අක් පත්ලෙන් හෝ විලුඹෙන් හෝ යන ගමන් ඇතිව; (6) පල්ලත්තිකාය, අතින් හෝ කඩින් හෝ අකවටු ඇවිලීම් ඇතිව; (7) සක්කච්චං, සිහි එළවා; පිණ්ඩපාතං, ආහාර; පටිග්ගහෙස්සාමීති, පිළි ගනිමියි; (8) පත්තසඤ්ඤී, පාත්‍රගත සංඥ ඇතිව; (9) සමසූපකං, බතින් සතරවන කොටස පමණවූ; මුද්ගසූපාදී, සූප ඇතිකොට, (10) සමතිත්තිකං, පාමූවවිට යට රේඛාව හා සමව පිරුණා වූ; පිණ්ඩපාතං, පිණ්ඩපාතය;

## තුන්වන ඛම්භකත වගයි.

(1 - 2) සක්කච්චං, සිත්එළවා; පිණ්ඩපාතං, අහර; (3 - 4) සපදානං, තම දිසාවෙහි පටන් පිළිවෙළින්; පිණ්ඩපාතං, අහර; භුඤ්ජිස්සාමීති, වළඳිමියි; (5) ථූපකතො, බත් මුදුන මැදින්; ඔමද්දිත්වා, හනා; (6) සූපංවා, මුද්ගසූපාදි සූප හෝ; බ්‍යඤ්ජනංවා, අවුලු හෝ; භීය්‍යොකම්‍යතං උපාදාය, බොහෝ කැමතිකම නිසා; ඔදනෙන, බතින්; න පටිච්ඡාදෙස්සාමීති, නො වසමියි; (7) සූපංවා, සූපය හෝ; ඔදනං වා, බත් හෝ; අගිලානො, නොගිලන්ව; අත්තනො අත්ථාය, තමා පිණිස; විඤ්ඤාපෙත්වා, ඉල්වා; න භුඤ්ජිස්සාමීති, නො වළඳිමියි; (8) උජ්ඣානසඤ්ඤී, කිපී සිත් ඇතිව; පරෙසං, අන්‍යයාගේ; පත්තං, වළඳන පාත්‍රය; න ඔලොකෙස්සාමීති, නො බලමියි: (9) අතිමහන්තං, මොණර බිජුවට සේ අති මහත් කොට; කබලං, ආලොපය; න කරිස්සාමීති, නො කරමියි, (10) පරිමණ්ඩලං, වටකොට;

## සතරවන සකස් වගයි.

(1) කබළෙ, ආලොපය; අනාහටෙ, මුවට නො එළවූ කල්හි; මුඛද්වාරං, මුඛය; න විවරිස්සාමීති, විවර නොකරන්නෙමියි, (2) භුඤ්ජමානො, වළඳමින්; සබ්බං හත්ථං, සියලු අත; මුඛෙ, මුඛයෙහි; න පක්ඛිපිස්සාමීති, නොලමියි; (3) සකබළෙන මුඛෙන, අහර සහිත වූ මුවෙන්; න බ්‍යාහරිස්සාමීති, නො බණිමියි; (4) පිණ්ඩුක්ඛෙපකං, ආලොපය මුඛයට දම දමා; (5) කබළාවච්ඡෙදකං, ආලොපය කඩ කඩාගෙන; (6) අවගණ්ඩකාරකං, වඳුරන් සේ කොපුලන රුස්කොට; (7) හත්ථනිද්ධූනකං, අත සල සලා; (8) සිත්ථාවකාරකං, බත්හුලු හිස හිස; (9) ජිව්හානිච්ඡාරකං, දිව නෙර නෙරා; (10) චපු චපු කාරකං, චපු චපු යන හඬ ඇති කොට හෙවත් පස් පැහැර පැහැර;

## පස්වන කබල වගයි.

(1) සුරු සුරු කාරකං, සුරු සුරු යන හඬ ඇතිකොට කොට; (2) හත්ථනිල්ලෙහකං, අත ලෙව ලෙව; පත්තනිල්ලෙහකං, එක ඇඟිල්ලෙකින් පාත්‍රය ලෙව ලෙව; (4) ඔට්ඨනිල්ලෙහකං දිවින් පිටිතොල් ලෙව ලෙව; (5) සාමිසෙන හත්ථෙන, ඇඳුල් සහිත අතින්; පානීයථාලකං, පැන්තලිය; (6) සසිත්ථකං, හුලු සහිත වූ; පත්තධොවනං, පා සේදූ දිය; අන්තරඝරෙ, ඇතුළු ගෙහි; න ඡඩ්ඩෙස්සාමීති, නොදමමියි, (7) ඡත්තපාණිස්ස, කුඩ ගත් අත් ඇති; අගිලානස්ස, නොගිලන්හට; ධම්මං, බණ; න දෙසිස්සාමීති, නො දෙසමියි; (8) දණ්ඩපාණිස්ස, වඩු රියනින් සතර රියන් පමණ දඬු ගත් අත් ඇති; (9) සත්ථපාණිස්ස, කඩු ආදී ශස්ත්‍ර ගත් අත් ඇති; (10) ආයුධපාණිස්ස, දුනු හෝ හී දඬු ගත් අත් ඇති;

## සවන සුරු සුරු වගයි.

(1) පාදුකා රූළ්හස්ස, පයලු මිරිවැඩි ඇති; (2) උපාහනා රූළ්හස්ස, පයලු වහන් ඇති; (3) යානගතස්ස; ජ දෝලි, ගැල් (රථ) යනාදියෙහි උන්නාවූ, (4) සයනගතස්ස, යටත් පිරිසෙයින් බිම ද හොත්තාවූ; (5) වෙඨිත සීසස්ස, කේසාන්තය නොපෙනෙන සේ පිළි ආදීන් වෙළන ලද ඉස් ඇති; (6) ඕගුණ්ඨිත සීසස්ස, හිසකෙහෙ නො පෙනෙන සේ පිළි ආදීන් වෙළන ලද ඉස් ඇති; (7 – 8) ඡමාය නිසී-දිත්වා, බිම හිඳ; ආසනෙ නිසින්නස්ස, ආසනයෙහි හුන්නාවූ; (9) නීචෙ ආසනෙ නිසීදිත්වා, මිටි අස්නෙහි හිඳ; උච්චෙ ආසනෙ නිසින්නස්ස, උස් ආසනයෙහි හුන්නාවූ; (10) ඨිතො, සිටියේ; නිසින්නස්ස, හුන්නාවූ; (11) පච්ඡතො ගච්ඡන්තො, පස්සෙහි යන්නේ; පුරතො ගච්ඡන්තස්ස, පෙරටුව යන්නාවූ; (12) උප්පථෙන ගච්ඡන්තො, නොමඟින් යන්නේ; පථෙන ගච්ඡන්තස්ස, මඟින් යන්නාවූ; (13) ඨිතො, සිටියේ; අගිලානො, නොගිළන්ව, උච්චාරං වා, මල කිස හෝ; පස්සාවං වා, වටන් කිස හෝ; (14) හරිතෙ, නිල්තණ ආදියෙහි; (15) උදකෙ, පරිභොග දියෙහි; අගිලානො, නොගිලන්ව; උච්චාරං වා, මල කිස හෝ; පස්සාවං වා, වටන් කිස හෝ; ඛෙළං වා, කෙළ හෝ; න කරිස්සාමීති, නො කෙරමියි; සික්ඛා, ශික්ෂා තොමෝ; කරණීයා, කටයුත්තීය.

### සත්වන පාදුක වගයි.

ආයසමන්තො, ආයුෂ්මත්නි; සෙඛියා ධම්මා, ශෛක්ෂ ධර්මයෝ; උද්දිට්ඨා ඛො, උදෙසන ලද්හ. තත්‍ථ, මෙහි; ආයස්මන්තෙ, ආයසමතුන්; පුච්ඡාමි, විචාරමි; එත්‍ථ, මේ සෙඛියා ධර්මයෙහි; පරිසුද්ධා කච්චි, පිරිසිදු ද? දුතියම්පි පුච්ඡාමි, දෙවනුවද විචාරමි; එත්‍ථ, මේ ශෛක්ෂ ධර්මයෙහි; පරිසුද්ධා කච්චි, පිරිසිදු ද? තතියම්පි පුච්ඡාමි, තුන්වන විටෙහිදු විචාරමි, එත්‍ථ, මේ ශෛක්ෂ ධර්මයෙහි; පරිසුද්ධා, පිරිසිදුහ; තස්මා තුණ්හී, එහෙයින් නිශ්ශබ්දය; එතං, මේ තුෂ්ණීම් භාවය; එවං ධාරයාමි, එසේ හෙයින් දරමි. පිරිසිදු හෙයිනැයි සලකමි.

## පිළිකුල් භාවනා සන්නය.

ඉමස්මිං කායෙ, මේ ශරීරයෙහි; කෙසා, ගලවලුයෙහි පටන් නළල හිමකොට, දෙකන් සිළුවෙන් උඩ හිස්කබල පිට සමෙහි පිහිටි කළු ලිහිණිය පඳුරක් මෙන් වූ; අඩුතුන් කෙළක් කේශයෝ; අැටි ඇත්තාහුය. ලොමා, අතුල් පතුල් මිස සෙසු සියලු කය පිළිබඳ සමෙහි පිහිටියා වූ කළු පිගුවන් පැහැ තල් මූලක් බඳු නවානූ දහසක් රෝමයෝ ද; නඛා, ඇඟිලි අග පිහිටි කුණු මස් පිළිපොතු බඳු විසිනිය පෙතු ද; දන්තා, මැටි සකක හිඳුවූ ලබු බිජු පෙළක් මෙන් දෙනිකට හට ගත් දත් ඇට දෙතිසක් ද; තචො, අඩු රුවක් වසා ලූ සුදු සම් සැව්ටියක් මෙන් දුර්මාංශය වසා සිටින

සිව්ය ද; මාංසං, දඹු බිත්තෙක්හි දුන් සැරමැටියක් මෙන් ඇටසැකිලි
වසා සිටින නවසියක් මස් පිඩු ද; නහාරු, කොළ සැලුනු මිනිදු
මඩවැල් කැඳුල්ලක් මෙන් ඇට සම් වැළඳ සිටිනා නවසියක් නහර
ද; අට්ඨි, උඩින් නො වසා මැටි නො ගසා තිබෙන ගෙමැදිරියක්
මෙන් ඇඟ ඇතුලේ තිබෙන තුන්සියයක් ඇට සහල් ද; අට්ඨි
මිඤ්ජා, ඉදී ගිය වේබඩයක් මෙන් ඇට කුලල් පුරා සිටිනා
ඇට මිදුලු ද; වක්කං, ගලවලුවෙන් නික්ම එක නටුයේ පලගත්
විලිකුන් අඹ දෙකක් මෙන් දෙතන මැද සිටිනා වකුගඩුවෙක් ද;
හදයං, පිටපොත්ත හළුවාලූ නෙළුම් කැකුලක් මෙන් හදවත මැතිර
සිටිනා හෘදයමාංශය ද; යකනං, (හෘදයමාංශයට) දකුණු භාගයෙහි
රත් කොබෝලීල පතෙක ආකාර ඇති තිවුඩු පිටියෙන් කළාවූ
පූවක් (කැවුමක්) නො සම කොට කැඩුවාක් මෙන් සිටියාවූ අක්මාව
ද; කිලොමකං, (ඒ අක්මාව වසා සිටියා හෙල දුහුලක් මෙන්)
දළඹුවෙක් ද; පිහකං, (ඒ හෘදය මාංශයට වම් භාගයෙහි කළු වස්-
සෙකුගේ දිවක් මෙන් හදවත මැතිර සිටිනා) බඩ දිවද; පපඵාසං, සැතිව
එල්ලෙන්නාවූ (පිළිකුල් කරන) පපුවෙක් ද; අන්තං, (ගලවලුයෙහි
පටන් අධෝමාර්ගය දක්වා දෙනක හොත්තාවූ ඉස, වල්පත නැති
ඇලි ගැරඩියෙකු මෙන් (ස්ත්‍රීන්ට අටවිසි රියනක් හා පුරුෂයන්ට
දෙතිස් රියනක් වූ) බඩවැලක් ද; අන්තගුණං, (එක්විසි තැනකින්
නැමී තිබෙන්නාවූ දෙතිස් රියන් බඩවැල පාපිස්නා බිස්සක් වෙලූ
ලණුවක් මෙන් අතුරු නොදී එපිට මෙපිට නොයන ලෙස බැඳ
සිටිනාවූ) අතුනු බහනෙක් ද; උදරියං, පෙරහන් කඩක ලූ සහලක්
මෙන් කෑ අහර සිටිනා වූ) උදරයෙක්ද; කරීසං, පෙකණියෙන් පහත
අධොමාගීයෙන් උඩ අටඟුලක් පමණ වසට කවුව දක්වා හුණ
කුළලක බහාලූ පඩුවන් මැටියක් මෙන් පුරා සිටිනා) අසූචි ද; පිත්තං,
(අක්මා, පපුව දෙයතුරෙහි මිදී ගිය ගිතෙල් වැක්තක් වැටකොළු
එළයක පිරුණක් මෙන් පුරා සිටිනා) පිත් කෝෂයද; සෙම්හං,
(උදර පටලය පටන් උගුර දක්වා කැලිය පොත්තක බෙලසුලක්
මෙන් පුරා සිටිනා) ශ්ලේෂ්මාවද; පුබ්බො,කණු කවු පහල තන්හි ද
ගඩපොල ආදී තන්හිද, කුනු මෙර මඩවන් ලේ පැසුණු සැරව ද;
ලොහිතං, මසින් ඉතිරි කෙස් ලොම් නිය දත් මිස (හැර) සෙසු
සියලු කය තුලෙහි ඇසිර සිටිනාවූ, ඉසිර සිටිනාවූ, පෑතීර සිටිනාවූ,
කැටිව සිටිනාවූ ලේ ද;සෙදෙ, නවුන් වළඳක වත්කළ දිය පිටින් වස්-
නාක් මෙන් නවානු දහසක් රෝම කූපයන්ගෙන් පිටත් වන්නා වූ
සෝදිය ද; මෙදෙ, කසා රුදු රෙද්දක් දෙතුන් වැසී කළාක් මෙන්
සම් මස් දෙයඅතුරෙහි සිටියාවූ මේද නම් තෙලද; අැසු, ඇස්ස
කපා බීපු තල්කස පැනෙක්හි වැසි පැනක් පුරා ගත්තාක් මෙන්
ඇස් දෙක පුරා සිටිනා කඳුලු ද; වසා, බතින් පෙරු කැඳිත්තක්
පිට ඉසි තෙලිත්තක් මෙන් ගිනී අව ආදියෙන් උණුවුම් ලැබුමෙන්

අතුල්, පතුල්, කන්, නාසා දසරු ආදී තැනින් පිටත් වන්නාවූ, වුරුණු තෙල් ද; ඛෙලො, අහර දුටු කල්හි හෝ අසන කල්හි, සනව බැඳී බිලයක මැඩි පෙණක් මෙන් දෙකපොල් වතින් එන්නාවූ කෙළ ද; සිඞ්ඝාණිකා, දෙම්නස් කල්හි ඉස් මුල් සිදුරු නෙතින් ලුණු බෙල්ලක දමක ලද දියක්තක් මෙන් නාසා පිරුණු සොටු ද; ලසිකා, එක්සිය අසූවක් සන්ධි තැන කිණිහිරි කදෙහි පහළ තැනින් බස්නා මැලියම් මෙන්; සන්ධි අතුරෙහි සිටිනා සඳ මිදුළුද; මුත්තං, නමා තිබූ කළයක වත්කළ කර දියත්තක් මෙන් විතක්පලා සපිරුණු මුත්‍රද; මත්ථකෙ මත්ථ ලුඞ්ගං ති, දුදුරු ලබු පලයක පිරු ලා දියැත්තක් මෙන් හිස් කබල පුරා සිටිනා හිස් මුල් ද; ඉමස්මිං කායෙ, මේ ශරීරයෙහි; අත්ථි, ඇත්තේය.

## වර්තමාන ප්‍රත්‍යවෙක්ෂාව.

යොනිසො, නුවණින්; පටිසංඛාය, සීත නැසීම ආදී ඒ ඒ ප්‍රයෝජන වෙන් වෙන් වශයෙන් සලකා; චීවරං, සිවුරු; පටිසෙවාමි, වැළඳ ගනිමි, කෙසේද? යාවදෙව, යම්තාක්ම හෙවත් හැම වේලෙහි; සීතස්ස පටිඝාතාය, සීත නසනු පිණිස ද; උණ්හස්ස පටිඝාතාය, උෂ්ණ නසනු පිණිසද; ඩංස, ඩැහැ ලේ බොන මැස්සෝය; මකස, මදුරුවෝය; වාත, සුළඟය; ආතප, අව්වය; සිරිංසප, දීර්ඝ ජාතිහුය, යන මොවුන්ගේ; සම්ඵස්සානං, පහස; පටිඝාතාය, නැසීම පිණිස ද; යාවදෙව, හැම කල්හි; හිරිකොපීන පටිච්ඡාදනත්ථං, ලජ්ජා ස්ථානය වසනා පිණිස ද වේ යයි කියාය.

යොනිසො, නුවණින්; පටිසඞ්ඛාය, සලකා; පිණ්ඩපාතං, පිඬු; පටිසෙවාමි, වළඳමි; කෙසේද? දවාය, කෙළනා පිණිසත්; නෙව, නො වෙම්ය; න මදාය, මද වඩනා සඳහාත් නොවේ. න මණ්ඩනාය, අඩු අඩුතැන් පිරවීම පිණිස ද නොවේ. න විභූසනාය, සැරසීම පිණිස ද නො වේ. යාවදෙව, යම්තාක්; ඉමස්ස කායස්ස, මේ ශරීරයාගේ; ඨිතියා, සිටීම පිණිසද; යාපනාය, යැපීම පිණිස ද; විහිංසූපරතියා, සා පිපාස හරණා පිණිස ද; බ්‍රහ්මචරියානුග්ගහාය, බඹසරට අනුග්‍රහ පිණිස ද වේ. ඉති, මෙසේ; පුරාණං වෙදනං ච, පැරණි බඩගිනි වේදනාව ද; පටිහඞ්ඛාමි, නසමි, නවං වෙදනඤ්ච, අලුත් දුක් වේදනාව ද; න උප්පාදෙස්සාමි, නූපදවන්නෙමි; මෙ, මාගේ; යාත්‍රා ච, දිවි පැවැත්ම ද; අනවජ්ජතා ච, නිවැරදි බවද; ඵාසු විහාරො චාති, සැප විහරණය ද වන්නේ යයි කියායි.

යාවදෙව, යම්තාක්ම හෙවත් හැම වේලෙහිම; සීතස්ස පටිඝාතාය, සීත නසන පිණිසද; උණ්හස්ස පටිඝාතාය, උෂ්ණ නසන පිණිස ද; ඩංස, ඩැහැ ලේ බොන මැස්සෝය; මකස, මදුරුවෝය; වාත, සුළඟය; ආතප,

අච්චය; සිරිංසප, දීර්ඝ ජාතීහුය; යන මොවුන්ගේ; සම්ඵස්සානං, ස්පර්ශය; පටිඝාතාය, නැසීම පිණිසද; යාවදෙව, සියලු කල්හිම; උතු-පරිස්සය විනොදනං, ඍතු පීඩාවන් දුරලීම පිණිසද; නොහොත් ශීත, වැසි, හිමවලා යුත් කාලය හා සිංහ ව්‍යාඝ්‍රාදී භය ද, රාග මෛෂාදී උවදුරු නසන පිණිස ද; පටිසල්ලානාරාමත්ථං, සිත එකඟ කිරීමෙහි ඇලෙන පිණිස ද වේ යයි; යොනිසො, නුවණින්; පටිසංඛාය, සලකා; සෙනාසනං සෙනසුන්; පටිසෙවාමි, සේවනය කරමි.

යාවදෙව, සම්තාක්ම හෙවත් හැම කල්හි, උප්පන්නානං, උපන්; වෙය්‍යාබාධිකානං, සිරුර පෙලන; වෙදනානං, දුක් වේදනාවන්; පටිඝාතාය, වැනසීම පිණිස ද; අබ්‍යාපජ්ඣ පරමතාය ඉති, ව්‍යාපාද රහිත බව, නිරෝගී බැව් උතුම් කොට ඇති බැව් පිණිස ද වේ යයි; යොනිසො, නුවණින්; පටිසඞ්ඛාය, සලකා; ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරං, ගිලන්පස බෙහෙත් පිරිකර; පටිසෙවාමි. වළඳමි.

## ධූතාංග

ශීලපාරිශුද්ධිය සඳහා ධුතාඞ්ග සමාදන්ව රක්‍ෂා කළ යුතු යයි විසුද්ධි මාර්ගාදියෙහි ප්‍රකාශිත හෙයින්, නිවන් ලබනු රිසි සියලු භික්ෂු, සාමණේර, උපාසක, උපාසිකාවන් විසින් ධුතාඞ්ග රක්‍ෂා කළ යුතුමය. එහි භෙද නම්:-

පඤ්චව සෙනාසනෙ වුත්තා – පඤ්චව ආහාර නිස්සිතා
එකො විරිය සංයුත්තො – ද්වෙව චීවර නිස්සිතා.

ආරඤ්ඤිකාඞ්ගය, රුක්ඛමූලිකාඞ්ගය, අබ්භොකාසිකාඞ්ගය, සොසානිකාඞ්ගය, යථාසන්ථතිකාඞ්ගය, යන අඞ්ගපස සෙනසුන පිළිබඳ තෘෂ්ණාව, දුරු කරනු සඳහා ද, පිණ්ඩපාතිකාඞ්ගය, සපදාන-චාරිකාඞ්ගය, පත්තපිණ්ඩිකාඞ්ගය, එකාසනිකාඞ්ගය, ඛලුපච්ඡාභත්ති-කාඞ්ගය යන පස පිණ්ඩයෙහි (ආහාරයෙහි) ආශාව දුරු කරනු සඳහා ද, නෙසජ්ජිකාඞ්ගය, වීර්‍ය්‍ය සඳහා ද, පාංශුකූලිකාඞ්ගය, තෙචී-වරිකාඞ්ගය යන අඞ්ග දෙක සිවුරු සඳහා ද වදාළහ.

මේ අඞ්ග තෙළෙසම උපසපන් භික්ෂූන් විසින් ද, තෙචීවරිකාඞ්ගය හැර ඉතිරි දොළොස හෙරණුන් විසින් ද, එකාසනිකාඞ්ගය, පත්ත පිණ්ඩිකාඞ්ගය යන අඞ්ග දෙක උපාසකාදීන් විසින් ද රක්‍ෂා කළ යුතු යයි දක්වන ලදී. ශීලපාරිශුද්ධිය සඳහා හෙරණුන් විසින් අත්‍යාම පරිච්ඡෙදයෙන් පාංශුකූලිකාඞ්ගය, පත්තපිණ්ඩිකාඞ්ගය යථා සන්තති-කාඞ්ගය යන අඞ්ගත්‍රයවත් රක්‍ෂා කළ යුත්තෝ වෙත්. එහෙයින් ඒ අඞ්ග ත්‍රයෙහි ප්‍රභෙද මාත්‍රය දක්වනු ලැබේ. ධුතාඞ්ග සමාදානය වනාහි ධුතා-ඞ්ගධර භික්ෂුවක් ඉදිරියෙහිද, එසේ නැතිනම් චෛත්‍ය ස්ථානයෙක්හි ද වේ.

“ගහපතිදානං චීවරං පටික්ඛිපාමි, පංසුකූලිකඞ්ගං සමාදියාමි” යන වාක්‍යය තෙවරක් කියා පාංශුකූලිකාඞ්ගය සමාදන් විය යුතුය. එසේ සමාදන් වූවහු විසින් තෙවිසිපාංශුකූල ක්ෂෙත්‍රයෙහි උපන් සිවුරුම දැරිය යුතු. උත්කෘෂ්ටය, මධ්‍යමය, මෘදුක යයි පාංශුකූලිකයෝ තිදෙනෙක් වෙති. සොහොනෙහිම වස්ත්‍ර ගන්නේ “උත්කෘෂ්ට” නම් වේ. “පැවිද්දෙ ගනිත්වා යි” තැබූ දෙය ගන්නේ “මධ්‍යම” නම් වේ. පාමුල තබා දෙන ලද්ද ගන්නේ “මෘදුක” නම් වේ. ගෘහපතීන් විසින් දුන් සිවුරු ඉවසූ කල්හි මේ අඞ්ගය බිඳේ.

පත්තපිණ්ඩිකාඞ්ගයද “දුතියක භාජනං පටික්ඛිපාමි, පත්තපිණ්ඩිකඞ්ගං සමාදියාමි” කියා සමාදන් විය යුතු. අනුභව කරන කාලයෙහි බත් ව්‍යඤ්ජනාදිය ප්‍රමාණ යුක්තව එකම භාජනයෙක්හි පිළිගැනීම කළ යුතු. කැඳ, බත්, ව්‍යඤ්ජන, කිරි, පැණි ආදිය එකම භාජනයක පිළිගැනීමෙන් පිළිකුල්වන හෙයින් වළඳන භාජනය තබා අනිකක් ගන්ට වටී. මෙය ද, උත්කෘෂ්ටය, මධ්‍යමය, මෘදුකය යි තෙවැදෑරුම් වේ. ඔවුන් අතුරෙන් “උත්කෘෂ්ටයා හට” උක් දඬු සපන කාලය හැර කසළ දමන්ට හෝ බත් කැටි, කැවිලි ආදිය කඩන්ට හෝ නොවැටී මධ්‍යමයා හට එක අතකින් කඩා කන්ට වටී. මෘදුකයාහට යමක් පාත්‍රයේ දමන්ට හැකිද, ඒ සියල්ලම අතින්, දතින්, සැතින් කඩා කනු වටී. මේ තිදෙනාගේම ධුතාඞ්ගය භාජන දෙකක් එකවිට ගෙන වැළඳීමෙන් බිඳේ.

යථා සන්ථතිකාඞ්ගය ද “සේනාසන ලොලුප්පං පටික්ඛිපාමි. යථා සන්ථතිකාඞ්ගං සමාදියාමි” කියා සමාදන් වූවහු විසින් තමන්ට යම් සෙනසුනක් පැමුණුනේ ද, එයින්ම සතුටුවිය යුතු. අනිකෙක් නො නැගිට විය යුතු. මෙය ද උත්කෘෂ්ට, මධ්‍යම, මෘදුක වශයෙන් තුන්වැදෑරුම් වේ. එහි උත්කෘෂ්ටයා හට පැමිණි සෙනසුන දුරද, ළඟද, සීතද, උෂ්ණද, අමනුෂ්‍ය, සර්ප, ගැරඬි ආදීන්ගෙන් පීඩාදැයි යනාදීන් විචාරන්ට නොලැබේ. මධ්‍යම් තෙම එසේ විචාරන්ට ලබයි. ගොස් බලන්ට නොලැබේ. මෘදුක තෙම ගොස් බලා රුචි නොවේ නම් අනිකෙකුට නොපැමිණි සෙනසුනක් ගන්ට ලබයි. මේ තුන් දෙනාගේම අඞ්ගය සේනාසන ලොලත්වයක් උපන් කල්හිම බිඳේ.

## චීවරාදී සිවුපසය ලබාගැනීමට සුදුසු දසනෑයෝ

ජෙට්ඨභාතා කණිට්ඨෝව – තථා භගිණියො දුවෙ
චූලමාතා චූලපිතා – මහා මාතා මහා පිතා
මාතුච්ඡා මාතුලො චෙති – දසමේ ඤාතයො මතා

වැඩි මහල් සහෝදරයා ද, බාල සහෝදරයා ද, වැඩිමහල් සහෝදරිය සහ බාල සහෝදරිය ද, සුළු පියා සහ මහ පියා ද, සුළු මව සහ මහ මව ද, නැන්දා සහ මාමා ද යන මේ දස දෙනාගෙන් හා මොවුන්ගේ සත්කුල පරම්පරානුගත නෑයන්ගෙන් ද චීවරාදී ප්‍රත්‍ය ඉල්වා ලබා ගත හැකි වේ.

## බුද්ධානුස්මෘති කර්මස්ථානය.

බුද්ධානුස්සති මෙත්තා ච – අසුභං මරණස්සති,
ඉති ඉමා චතුරාරක්ඛා – භික්ඛු භාවෙය්‍ය සීලවා.

අනන්තවිත්ථාරගුණං – ගුණතොනුස්සරං මුනිං,
භාවෙය්‍ය බුද්ධිමා භික්ඛු – බුද්ධානුස්සති මාදිතො.

සවාසනෙ කිලෙසෙ සො – එකො සබ්බෙ නිඝාතිය,
අහු සුසුද්ධ සන්තානො – පූජානඤ්ච සදාරහො.

සබ්බකාල ගතෙ ධම්මෙ – සබ්බෙ සම්මා සයං මුනි,
සබ්බාකාරෙන බුජ්ඣිත්වා – එකො සබ්බඤ්ඤුතං ගතො.

විපස්සනාදි විජ්ජාහි – සීලාදි චරණෙහි ච,
සුසමිද්ධෙහි සම්පන්නො – ගගනාභෙහි නායකො.

සම්මා ගතො සුභං ඨානං – අමොඝ වචනො ච සො,
තිවිධස්සාපි ලොකස්ස – ඤාතා නිරවසෙසතො.

අනෙකෙහි ගුණොඝෙහි – සබ්බ සත්තුත්තමො අහු,
අනෙකෙහි උපායෙහි – නරදම්මෙ දමෙසි ච.

එකො සබ්බස්ස ලොකස්ස – සබ්බසත්ථානුසාසකො,
භාග්‍ය ඉස්සරියාදීනං – ගුණානං පරමො නිධි.

පඤ්ඤාස්ස සබ්බ ධම්මෙසු – කරුණා සබ්බ ජන්තුසු,
අත්තත්ථානං පරත්ථානං – සාධිකා ගුණ ජෙට්ඨිකා.

දයාය පාරමී චිත්වා – පඤ්ඤායත්තාන මුද්ධරි,
උද්ධරි සබ්බ ධම්මෙ ච – දයා යඤ්ඤෙ ච උද්ධරි.

දිස්සමානොපි තාවස්ස – රූපකායො අචින්තියො,
අසාධාරණ ඤාණඩ්ඪෙ – ධම්මකායෙ කථාව කා'ති.

## මෛත්‍රී කර්මස්ථානය

අත්තූපමාය සබ්බෙසං – සත්තානං සුඛකාමතං,
පස්සිත්වා කමතො මෙත්තං – සබ්බ සත්තෙසු භාවයෙ.

සුඛී භවෙය්‍යං නිද්දුක්ඛො – අහං නිච්චං අහං විය,
හිතා ච මෙ සුඛී හොන්තු – මජ්ඣත්තාථ ච වෙරිනො.

ඉමම්හි ගාමක්ඛෙත්තම්හි – සත්තා හොන්තු සුඛී සදා,
තතො'පරඤ්ච රජ්ජෙසු – චක්කවාළෙසු ජන්තුනො.

සමන්තා චක්කවාළෙසු – සත්තානන්තෙසු පාණිනො,
සුඛිනො පුග්ගලා භූතා – අත්තභාවගතා සියුං.

තථා ඉත්ථී පුමා චෙව – අරියා අනරියාපි ච,
දෙවා නරා අපායට්ඨා – තථා දස දිසාසුවා'ති.

## අසුභ කර්මස්ථානය

අවිඤ්ඤාණාසුභනිභං – සවිඤ්ඤාණාසුභං ඉමං,
කායං අසුභතො පස්සං – අසුභං භාවයෙ සතිං.

වණ්ණ සණ්ඨාන ගන්ධෙහි – ආසයො කාසතො තථා,
පටිකූලානි කායෙ මෙ – කුණපානි ද්විසොළස.

පතිතම්හාපි කුණපා – ජෙගුච්ඡං කාය නිස්සිතං,
ආධාරො හි සුචීනස්ස – කායෙ තු කුණපෙ ඨිතං.

මීළ්හ කිමි ච කායො'යං – අසුචිම්හි සමුට්ඨිතො,
අන්තො අසුචි සම්පුණ්ණො – පුණ්ණවච්ච කුටී විය.

අසුචි සන්දතෙ නිච්චං – යථා මෙදක ථාලිකා,
නානාකිමි කුලාවාසො – පක්කචන්දනිකා විය.

ගණ්ඩභූතො රොගභූතො – වණභූතො සමුස්සයො,
අතෙකිච්ඡො'ති ජෙගුච්ඡො – පභින්න කුණපූපමො'ති.

## මරණානුස්මෘති කර්මස්ථානය

පවාත දීප තුල්‍යාය – සායුසන්තති යාක්ඛයං,
පරූපමාය සම්පස්සං – භාවයෙ මරණස්සතිං.

මහා සම්පත්ති සම්පත්තා – යථා සත්තා මතා ඉධ,
තථා අහං මරිස්සාමි – මරණං – මම හෙස්සති.

උප්පත්තියා සහෙ වෙදං – මරණං ආගතං සදා,
මාරණත්ථාය ඔකාසං – වධකො විය එසති.

ඊසකං අනිවත්තන්තං – සතතං ගමනුස්සුකං,
ජීවිතං උදයා අත්ථං – සූරියො විය ධාවති.

පිප්ජු බුබ්බුල උස්සාව – ජලරාජි පරික්ඛයං,
ඝාතකොව රිපූතස්ස – සබ්බත්ථාපි අවාරියො.

සුඛසත්තාම් පුඤ්ඤිද්ධි – බුද්ධි වුද්ධි ජිනද්වයං,
ඝාතෙසි මරණං ඛිප්පං – කාතු මාදිස කෙ කථා.

පච්චත්තානඤ්ච වෙකල්‍යා – බාහිරජ්ඣත්තුපද්දවා,
මරා'මොරංකිමෙසාපි – මරමානො අනුක්ඛණංනති.

## අෂ්ට මහා සංවෙග වස්තු.

හාවෙත්වා චතුරාරක්ඛා – ආවජ්ජෙය්‍ය අනන්තරං,
මහා සංවෙග වත්ථූනි – අට්ඨ අට්ඨිත විරියො.

ජාති ජරා ව්‍යාධි චුති අපායා – අතීත අප්පත්තක වට්ට දුක්ඛං,
ඉදානි ආහාර ගවෙට්ඨි දුක්ඛං – සංවෙග වත්ථූනි ඉමානි අට්ඨ.

පාතො ච සාය' ම පි චෙව ඉමං විධිඤ්ඤූ,
ආ සෙවතෙ සතත මත්ත හිතාභිලාසී.

පප්පොති සොත්ථි විපුලං හත පාරිපන්ථො,
ඵුට්ඨං සුඛං මුනිවිසිට්ඨ මතං සුඛෙන චාති.

## පැවිදිවූවන් විසින් පුහුණු කළ යුතු පිරිත්.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

## ඇණවුම් පිරිත.

යෙ සන්තා සන්ත චිත්තා තිසරණ සරණා එත්ථ ලොකන්තරෙ වා
භුම්මා භුම්මා ච දෙවා ගුණගණ ගහණබ්‍යාවටා සබ්බකාලං,
එතෙ ආයන්තු දේවා වරකනකමයෙ මෙරු රාජෙ වසන්තො
සන්තො සන්තොසහෙතුං මුනිවර වචනං සොතු මග්ගං සමග්ගං.

සබ්බෙසු චක්කවාළෙසු – යක්ඛා දෙවාච බ්‍රහ්මුනො,
යං අම්හෙහි කතං පුඤ්ඤං – සබ්බ සම්පත්ති සාධකං.

සබ්බෙ තං අනුමොදිත්වා – සමග්ගා සාසනෙ රතා,
පමාද රහිතා හොන්තු – ආරක්ඛාසු විසෙසතො.

සාසනස්ස ච ලොකස්ස – වුද්ධී භවතු සබ්බදා,
සාසනම්පි ච ලොකං ච – දෙවා රක්ඛන්තු සබ්බදා.

සද්ධිං හොන්තු සුඛී සබ්බෙ – පරිවාරෙහි අත්තනො,
අනීඝා සුමනා හොන්තු – සහ සබ්බෙහි ඤාතිභි.

රාජතො වා, චොරතො වා, මනුස්සතො වා අමනුස්සතො වා අග්ගිතො වා උදකතො වා පිසාචතො වා ඛාණුකතො වා කණ්ටකතො වා, නක්ඛත්තතො වා ජනපදරොගතො වා අසද්ධම්මතො වා අසන්දිට්ඨිතො වා අසප්පුරිසතො වා චණ්ඩ හත්ථි අස්ස මිග ගොණ කුක්කුර අහිවිච්ඡික මණිසප්පදීපි, අච්ඡ තරච්ඡ සූකර මහිස යක්ඛ රක්ඛසාදීහි, නානා භයතො වා නානා රොගතො වා නානා උපද්දවතො වා ආරක්ඛං ගණ්හන්තු, පණිධානතො පට්ඨාය තථාගතස්ස දස පාරමියො දස උපපාරමියො දස පරමත්ථ පාරමියො, පඤ්ච මහා පරිච්චාගෙ තිස්සො චරියා පච්ඡිම භවෙ ගබ්භාවක්කන්තිං ජාතිං අභිනික්ඛමනං පධානචරියං බොධිපල්ලඞ්කෙ මාරවිජයං, සබ්බඤ්ඤුතඤ්ඤාණ පටිවෙධං නව ලොකුත්තර ධම්මෙති සබ්බෙපිමෙ බුද්ධගුණෙ ආවජ්ජිත්වා වෙසාලියං තීසු පාකාරන්තරෙසු, තියාමරත්තිං පරිත්තං කරොන්තො ආයස්මා ආනන්දත්ථෙරො විය කාරුඤ්ඤ චිත්තං උපට්ඨපෙත්වා.

භික්ඛූනං ගුණ සංයුත්තං යං දෙසෙසි මහා මුනි
යං සුත්වා පටිපජ්ජන්තා - සබ්බ දුක්ඛා පමුච්චති.
සබ්බ ලොක හිතත්ථාය පරිත්තං තං භණාමහෙ.

## දස ධම්ම සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ, තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. භික්ඛවොති! භදන්තෙ’ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච. දස ඉමෙ භික්ඛවෙ ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බා, කතමෙ දස?

වෙවණ්ණියම්හි අජ්ඣුපගතොති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං. පරපටිබද්ධා මෙ ජීවිකාති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං. අඤ්ඤො මෙ ආකප්පො කරණීයොති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං, කච්චිනුඛො මෙ අත්තා සීලතො න උපවදතීති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං. කච්චිනුඛො මං අනුවිච්ච විඤ්ඤූ සබ්‍රහ්මචාරී සීලතො න උපවදන්තීති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං. සබ්බෙහි මෙ පියෙහි මනාපෙහි නානා භාවො විනා භාවොති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං. කම්මස්සකොම්හි කම්මදායාදො කම්මයොනි කම්ම බන්ධු කම්ම පටිසරණො යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදො භවිස්සාමීති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං. කථම්භූතස්ස මෙ රත්තිං දිවා වීතිපතන්තීති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං. කච්චිනුඛොහං සුඤ්ඤාගාරෙ අභිරමාමීති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං. අත්ථිනුඛො මෙ උත්තරි මනුස්ස

ධම්මා, අලමරිය ඤාණ දස්සන විසෙසො අධිගතො සොහං පච්ඡිමෙ කාලෙ, සබ්‍රහ්මචාරීහි පුට්ඨො න මංකු භවිස්සාමීති, පබ්බ-ජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉමෙ ඛො භික්ඛවෙ දස ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බාති. ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති,

## මහා මඞ්ගල සුත්තං

යං මංගලං ද්වාදසසු – චින්තයිංසු සදෙවකා,
සොත්ථානං නාධිගච්ඡන්ති – අට්ඨතිංසංච මංගලං.
දෙසිතං දෙව දෙවෙන – සබ්බපාප විනාසනං,
සබ්බ ලොක හිතත්ථාය – පරිත්තං තං භණාමහෙ.

එවං මෙ සුතං එකං සමයං භගවා, සාවත්ථියං විහරති, ජෙතවනෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ, අථඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවල කප්පං ජෙත-වනං ඔභාසෙත්වා, යෙන භගවා තෙනුපසංකමි, උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි, එකමන්තං ඨිතා ඛො සා දෙවතා, භගවන්තං ගාථාය අජ්ඣභාසි.

බහූදෙවා මනුස්සාච – මංගලානි අචින්තයුං, ආකඞ්ඛමානා සොත්ථානං බ්‍රෑහි මංගල මුත්තමං. අසෙවනා ච බාලානං පණ්ඩි-තානඤ්ච සෙවනා, පූජාච පූජනීයානං, එතං මංගල මුත්තමං. පතිරූප දෙස වාසො ච පුබ්බෙ ච කතපුඤ්ඤතා, අත්තසම්මා පණිධි ච, එතං මංගල මුත්තමං. බාහු සච්චං ච සිප්පං ච විනයො ච සුසික්ඛිතො, සුභාසිතා ච යා වාචා, එතං මංගල මුත්තමං. මාතා පිතු උපට්ඨානං පුත්තදාරස්ස සංගහො, අනාකුලා ච කම්මන්තා, එතං මංගල මුත්තමං. දානඤ්ච ධම්මචරියා ච, ඤාතකානං ච සංගහො, අනවජ්ජානි කම්මානි, එතං මංගල මුත්තමං. ආරති විරති පාපා මජ්ජපානා ච සඤ්ඤමො, අප්පමාදො ච ධම්මෙසු, එතං මංගල මුත්තමං. ගාරවො ච නිවාතො ච සන්තුට්ඨී ච කතඤ්ඤුතා, කාලෙන ධම්ම සවණං, එතං මංගල මුත්තමං. ඛන්තී ච සොවචස්සතා සමණානඤ්ච දස්සනං, කාලෙන ධම්ම සාකච්ඡා, එතං මංගල මුත්තමං. තපො ච බ්‍රහ්මචරියඤ්ච අරියසච්චාන දස්සනං, නිබ්බාන සච්ඡිකිරියා ච, එතං මංගල මුත්තමං. ඵුට්ඨස්ස ලොක ධම්මෙහි චිත්තං යස්ස න කම්පති, අසොකං විරජං ඛෙමං, එතං මංගල මුත්තමං. එතාදිසානි කත්වාන සබ්බත්ථ මපරාජිතා, සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං තෙසං මංගල මුත්තමන්ති.

# රතන සුත්තං

කොටි සතසහස්සෙසු - චක්කවාළෙසු දෙවතා,
යස්සානං පටිග්ගණ්හන්ති - යඤ්ච වෙසාලියං පුරෙ.
රොගාමනුස්ස දුබ්භික්ඛ - සම්භූතං තිවිධං භයං,
ඛිප්පමන්තරධාපෙසි - පරිත්තං තං භණාමහෙ.

